Department of Education, Sabaragamuwa Province/ Weekly School

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - ව්‍යාපාර සංඛ්‍යානය

සතිය - 6

ශ්‍රේණිය - 13

සකස් කළේ - කලාප අධ්‍යාපන කාර්යාලය ,රත්නපුර

නිපුණතාව 7.0 -ව්‍යාපාරික තීරණ ගැනීම සඳහා සංඛ්‍යාන නිමානය යොදා ගනියි.

නිපුණතා මට්ටම 7.6 - සංගහන පරාමිති නිමානය සඳහා ලක්ෂ්‍යමය නිමානය භාවිත කරයි.

- **<u>සංඛ්‍යාන නිමානය</u>** - සංගහනයකින් තෝරා ගනු ලබන සසම්භාවී නියැදි පදනම් කර ගෙන ලබා ගන්නා සංඛ්‍යාති (නියැදි අවයවයන්ගේ ශ්‍රිත) මගින් සංගහනයේ අඥාත (නොදන්නා) පරාමිති ප්‍රකාශ කිරීමේ ක්‍රියාවලියයි.
- සංඛ්‍යාන නිමානය ප්‍රධාන කොටස් දෙකකි.

1.ලක්ෂ්‍යමය නිමානය

2.ප්‍රාන්තර නිමානය

**<u>ලක්ෂ්‍යමය නිමානය</u>** - නියැදි සංඛ්‍යාතිය නිමානකය ලෙස සලකමින් සංගහනයේ අඥාත පරාමිතිය තනි අගයකින් නිමානය කිරීමයි.

**<u>නිමානකය</u>** - අඥාත පරාමිතියෙහි අගය නිමානය කිරීම සඳහා භාවිත කරනු ලබන නියැදි අවයවයන්ගේ ශ්‍රිතය (සංඛ්‍යාතිය) නිමානකය යනුවෙන් හැඳින්වේ.

**<u>අභ්‍යාස</u>**

ආයතනයක සේවකයන් 5 දෙනෙකුගේ නම් සහ මාසික වැටුප පහත දැක්වේ.

| නම | නිමල් | අමර | තුසිතා | සාමා | කුමාර |
|---|---|---|---|---|---|
| මාසික වැටුප රු. | 20,000 | 30,000 | 10,000 | 10,000 | 30,000 |

1.වරකට තිදෙනෙකු බැගින් වන පරිදි ලබා ගත හැකි සියලුම ප්‍රතිස්ථාපන රහිත නියැදි ලියා දක්වන්න.
2.එම එක් එක් නියැදිවලට අදාළව ඔවුන්ගේ වැටුප් නියැදි දත්ත ලෙස ලියා දක්වන්න.
3.එක් එක් නියැදියේ මධ්‍යන්‍යය ගණනය කරන්න.
4.ආඥාත පරාමිතිය නම් කරන්න.
5.නිමානකය නම් කරන්න.
6.නියැදි දත්ත පදනම් කර ගෙන ඔබ විසින් නම් කරන ලද නිමානකයේ අගය ගණනය කරන්න.